සැබැවින්ම අලි -රළියල්ලලාහු අන්හු- තුමා, නැග යන්නට සත්වයකු ගෙන ආහ. එතුමාගේ පාදය එම වාහනයේ තැබූ කල්හි බිස්මිල්ලාහ් යැයි පැවසූහ.

අලි ඉබ්නු රබීආ තුමා විසින් වාර්තා කරන ලදී. “මම අලී ඉබ්නු අබූ තාලිබ් -රළියල්ලාහු අන්හු- තුමා වෙත පැමිණියෙමි. එතුමා නැග යන්නට සත්වයෙකු ගෙන ආහ. එතුමාගේ පාදය එතුමා එම වාහනය මත තැබූ කල්හි: الله بسم බිස්මිල්ලාහ් (අල්ලාහ්ගේ නාමයෙනි) යැයි පැවසූහ. ඒ මත නැග සමාන්තරව සිටි කල්හි, لمنقلبون ربنا إلى وإنا ،نين

ُ الحمد لله الذي سخر لنا هذا وما كنا له مقْرِ
අල්හම්දු ලිල්ලාහිල්ල දී සහ්හඃර ලනා හාදා වමා කුන්නා ලහූ මුක්රිනීන් වඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන්. (අපි එයට සමීපවීමට හැකියාවක් නොතිබුණ තත්ත්වයක සිටිය දී අපට එය වසඟ කර දුන් අල්ලාහ්ටම සියලු ප්රශංසා, තවද සැබැවින්ම අපි අපගේ පරමාධිපති වෙතටම පෙරළී යන්නන් වෙමු.) යැයි පැවසූහ. පසුව لله الحمد අල්හම්දු ලිල්ලාහ් (සියලු පැසසුම්

අල්ලාහ්ටය) යැයි තුන්වරක් පැවසූහ. පසුව أكبر الله අල්ලාහු අක්බර් (අල්ලාහ් අති ශ්රේෂ්ටය) යැයි තුන්වරක් පැවසූහ. පසුව إلا الذنوب يغفر لا إنه لي فاغفر نفسي ظلمت إني سبحانك أنت සුබ්හානක ඉන්නී ළලම්තු නෆ්සී ෆග්ෆිර්ලී ඉන්නහූ ලා යග්ෆිරුද් දුනූබ ඉල්ලා අන්ත (ඔබ සුවිශුද්ධය. සැබැවින්ම මම මාහටම අපරාධ සිදු කර ගත්තෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව. නියත වශයෙන්ම ඔබ හැර පව්වලට කිසිවකු සමාව දෙන්නේ නැත.) යැයි පැවසූහ. පසුව මඳ ලෙස සිනහසුනහ. ‘අහෝ මුඃමින්වරුන්ගේ නායකයාණනි, ඔබ කවර හේතුවක් නිසා සිනහසුනෙහිද?‘ යැයි විමසන ලදී. ‘අල්ලාහ්ගේ දූතයාණන් මා සිදු කළාක් මෙන්ම සිදු කොට පසුව එතුමා සිනහවනු මම දුටුමි. පසුව මම අල්ලාහ්ගේ දූතයාණනි!ඔබ කවර හේතුවක් නිසා සිනහසුනෙහිද‘ යැයි විමසුවෙමි. එතුමා, ‘සැබැවින්ම ඔබේ පරමාධිපති, ගැත්තකු මා හැර
පාපයන් සමාව දෙන කිසිවකු නොමැතැයි දැන, මාගේ පව්වලට මට සමාව දෙනු මැනව යැයි පවසන
විට ඔහු ගැන පුදුමයට පත් විය. යැයි පැවසූහ.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත -
අහ්මද් එය වාර්තා කර ඇත]

අලී ඉබ්නු රබීආ තුමා විසින් වාර්තා කරන ලදී. එතුමා තාබිඊන්වරුන් අතුරින් ජ්යෙෂ්ඨ තාබිඊන්වරයෙකි. එතුමා මෙසේ පවසා සිටියහ. මම අලී ඉබ්නු අබී තාලිබ් තුමා මුණ ගැසුණෙමි. එතුමාගේ වාහනයේ එතුමා පැමිණියේය. එකල, වාහනය යනු මහපොළොවේ ප්රවාහනය සඳහා යොදාගත් සිවුපාවුන්ය. එතුමා තම පාදය එම වාහනයේ තැබූ විට බිස්මිල්ලාහ් යැයි පැවසූහ. එනම්, අල්ලාහ්ගේ නාමයෙන් මම නගිමි යන්නයි. උගේ පිටමත නැග වාඩි වූ කල්හි අල්හම්දු ලිල්ලාහ් යැයි පැවසූහ. එනම්, මෙම අතිමහත් දායාදය සඳහා අල්ලාහ්මට සියලු ප්රශංසා යන්නයි. එම දායාදය වනාහි, එම සත්වයාගේ යටහත් පහත් භාවයයි. අපි ඌ මත කිසිදු හානියකින් තොරව සුරක්ෂිතව නැග යන්නට උෟ තුළ ඇති කළ අවනත භාවයයි. එය අපට වසග කර දුන් ප්රකාශයෙන් පැහැදිලි වන්නේය. එනම්, නැග යෑම සඳහා අපට අවනතව විය. (අප ඒ සඳහා හැකියාව දරන්නන් ලෙස නොසිටියෙමු. තවද අපි අපගේ පරමාධිපති වෙත පෙරළා යන්නන් වෙමු.) පසුව තමන් වෙත දැක්වූ ආශිර්වාදය වෙනුවට අල්ලාහ්ට ප්රශංසා කිරීමෙන් පසුව වෙනත් කිසිවක් සමඟ සම්බන්ධ නොකොට (අල්හම්දු ලිල්ලාහ්) යැයි තුන්වරක් පැවසූහ. මෙසේ වාර ගණනාවක් පැවසීමට හේතුව අල්ලාහ්ගේ කීර්තිය සංකේතවත් කිරීමකි. ගැත්තා බලය නොදරන අතර අල්ලාහ් ඔහුගේ ශක්තියෙන් නිසි ශක්තිය ලබා දෙයි. ඌ අල්ලාහ්ට අවනත වී පසුව ඒ අනුව තමන්ටද අවනත වන්නට අණවනු ලැබූවකි. අල්ලාහු අක්බර් යැයි

http://sunnah.global/hadeeth/si/show/5271